පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ:- 2026/04

මගේඅංකය:එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්/05/07
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2026.02. 14

ආණ්ඩුකාරවර ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
පළාත් සභා ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා ,
පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත,

**<u>පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව (මු.රෙගුලාසි 104 ප්‍රකාරව) පරීක්ෂණ සඳහා පත්කරනු ලබන නිලධාරීන්ට දීමනාවක් ගෙවීම.</u>**

2025.12.19 දින පැවති පළාත් සභා ප්‍රධාන විගණන කමිටුවේදී පළාත් සභාවේ බෙහෝ ආයතනවල සිදු වූ අලාභයක් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව (මු.රෙ.104 ප්‍රකාරව) පරීක්ෂණ කිරීම සඳහා කමිටු ගණනාවක් පත් කර ඇති බවත්, එම කිමිටු විසින් සිය වාර්තා ඉදිරිපත් කර නැති බවත්, අනාවරණය වීමෙන්, එම පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීමට හැකිවන පරිදි එම පරීක්ෂණ පැවරී ඇති නිලධාරීන්ට කිසියම් දීමනාවක් ගෙවීමට සුදුසු බවට පැනනැගුනු අදහස් සැළකිල්ලට ගෙන පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව (මු.රෙ.104) පරීක්ෂණ සඳහා පත් කරනු ලබන නිලධාරීන්ට මෙම පරීක්ෂණ සඳහා ගෙවනු ලබන, ගමන් වියදම්, සංයුක්ත දීමනා, අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප්වලට අමතරව, පහත දක්වා ඇති සීමාවන්ට යටත්ව අලාභ වශයෙන් හඳුනාගනු ලබන මුලින් 1%ක් දක්වා රු.2,500.00 ක අවමයකට හා රු.5,000.00 ක උපරිමයකට යටත්ව දීමනාවක් ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

02. මෙම දීමනා ව්‍යුහය හඳුන්වාදීමේ අරමුණ වනුයේ පළාත් සභාවේ විවිධ ආයතන වල පවතින පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව (මු.රෙ.104) පරීක්ෂණ ගණනනාවක් ප්‍රමාද වී පවතින නිසාත්, ඒවා කඩිනමින් අවසන් කර ගත යුතුව ඇති නිසාත් වන හෙයින්,

2.1. මෙම චක්‍රලේඛයේ දිනට මාස 03ට පෙර පත් කර ඇති එම කමිටු විසින් සිය වාර්තා චක්‍රලේඛය නිකුත් කළ දින සිට දින 30 ක් ඇතුළත ලබාදෙන්නේ නම්, ඉහත සඳහන් කළ මුළු දීමනාව ගෙවීම හා ඉන්පසු ප්‍රමාද වන සෑම දිනක් වෙනුවෙන්ම දීමනාවෙන් 1% බැගින් අඩුකර ගෙවීම.

2.2. මෙම චක්‍රලේඛයේ දින සිට මාස 03 වඩා අඩු කාලයකට පෙර පත් කරන ලද කමිටුව විසින් මාස 03න් ඉතිරි කාලයට අමතරව දින 30 ක අතිරේඛ කාලයක් ලබා දෙන අතර (සම්පූර්ණ කාලය දින 90 නොඉක්මවන පරිදි) ඉහත සඳහන් මුළු දීමනාව ගෙවන අතර ඉන් පසු ප්‍රමාද වන එක් දිනක් වෙනුවෙන් 1% බැගින් අඩු කිරීම.

2.3. දීමනා ගෙවීමේදී පරීක්ෂණය සඳහා පත්කළ දින සිට මාස 03ක් ඇතුළත අදාල කමිටුව විසින් සිය වාර්තාව ලබා දී ඇත්නම්, ඉහත සඳහන් මුළු දීමනාවද, මාස 03 පසු වී ගත වී ඇති එක් දිනක් වෙනුවෙන්ම දීමනාවෙන් 1% බැගින් අඩුකර ගෙවීම.

2.4. කිසියම් අවස්ථාවක පරීක්ෂණ කමිටුවක් විසින් කිසියම් අලාභයක් හඳුනාගෙන නොමැති වීම ඉහත සඳහන් කළ අඩුම දීමනාව වන එක් අයෙකුට රු.2,500.00 ක දීමනාවක් ගෙවීම.

03. ඒ අනුව, 2026.01.01 දින සිට මූල්‍ය රීති 54.6 (මු.රෙ.104) ප්‍රකාර පරීක්ෂණය සඳහා ගෙවීම් කිරීමේදී මෙම දීමනා ව්‍යුහය අදාල කරගත යුතු වේ.

ජේ.එම්.ආර්.පී.ජයසිංහ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත 01. විගණකාධිපති - දැ.පි.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත - දැ.පි.